**අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ ) උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2013**
**පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රය.**

**ව්‍යාපාර අධ්‍යයනය II** **කාලය-පැය තුනයි**

***සකස් කිරීම :- අධ්‍යාපන අමාත්‍යංශයේ වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාවේ මෙහෙයවීමෙන්***
**සැලකිය යුතුයි : එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

**(සියලුම හිමිකම් ඇවිරිනි)**

## I කොටස

01. i) "වර්තමාන සමාජයේ මිනිසාගේ පැවැත්මට මෙන් ම ආර්ථික සංවර්ධනයට ද ව්‍යාපාර අත්‍යවශ්‍ය සාධකයකි." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii) ලාභය උපරිම කිරීමට අමතර ව ව්‍යාපාරයකට තවත් අරමුණු තිබිය හැකි ය. එවැනි අරමුණු හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii) "ඇල්මැති පාර්ශව ව්‍යාපාර කෙරෙහි සැලකිලිමත් වනවා මෙන් ම ව්‍යාපාර ද ඇල්මැති පාර්ශව කෙරෙහි සැලකිලිමත් වේ."
මෙසේ <u>ව්‍යාපාර</u> කෙරෙහි ඇල්මැති පාර්ශව හතරක් නම් කර එම පාර්ශව <u>කෙරෙහි</u> <u>ව්‍යාපාර</u> සැලකිලිමත් විමට හේතු මොනවා දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv) (අ) ව්‍යාපාරයකට බලපෑම් කරනු ලබන සාර්ව පරිසර සාධක නම් කරන්න. (ලකුණු 02)

(ආ) ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ දී බොහෝවිට සාර්ව පරිසර සාධක කිහිපයක් එකවර බලපෑම් කරනු ලබයි. එවැනි අවස්ථා දෙකක් නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 02)

v) (අ) ව්‍යාපාර විසින් නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළ ආචාර ධර්ම පිළිපැදීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු මොනවා ද? (ලකුණු 02)

(ආ) සමාජ වගකීම් ඉටු කිරීම තුළින් ව්‍යාපාරයකට අත්පත් කර ගත හැකි ප්‍රතිලාභ මොනවාද? (ලකුණු 02)

02. i) ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරනු ලබන උපකරණ නම් කර ඒවායින් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii) (අ) පාරිභෝගික ආරක්ෂණය යනුවෙන් අදහස් වන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 01)

(ආ) පාරිභෝගිකයන්ට හා නිෂ්පාදකයන්ට (ව්‍යාපාරිකයන්ට) පාරිභෝගික ආරක්ෂණය වැදගත් වීමට හේතු වෙන වෙන ම සඳහන් කරන්න. (ලකුණු 03)

iii) කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර, ඒවායේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv) ඇපයෙන් සීමිත සමාගමක් සහ සීමිත පොදු සමාගමක් අතර දැකිය හැකි වෙනස්කම් මොනවාද? (ලකුණු 04)

v) "තරගකාරී සංකීර්ණ ආර්ථිකය තුළ සමුපකාර ව්‍යාපාරය ද තරගකාරීත්වයට යොමු වෙමින් පවතී." එවැනි ප්‍රවණතා **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04)

03. i) නවෝදා, නව ව්‍යාපාර අවස්ථා ග්‍රහණය කර ගෙන අවදානම කළමනාකරණය කරමින් ලාභ උපයයි. ව්‍යාපාරය පැවැත්මට අදාළ තිරණ ගන්නා ඇය පාලන කටයුතු ද අවශ්‍යතාව මත වෙනස් කරමින් සිදු කරයි. ව්‍යාපාරය සතු සම්පත් මනා ලෙස හසුරුවන ඇය අනාගතයේ තම ව්‍යාපාරය තුළින් ජාත්‍යන්තර වෙළෙඳ පොළට පිවිසීමට අපේක්ෂාවෙන් සේවකයන් දිරිගන්වයි. ඉහත සිද්ධිය ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) නවෝදා තුළ පවතින ව්‍යවසායකත්ව ගතිලක්ෂණ **හතරක්** දක්වන්න. (ලකුණු 02)

(ආ) "ව්‍යවසායකයා සෑම විටම කළමනාකරුවකු ද වේ." මෙම ප්‍රකාශයට අනුව නවෝදා ඉටු කරන කළමනාකරණ කාර්යයන් මොනවාද? (ලකුණු 02)

ii) (අ) "වර්තමාන වෙනස් වන ලෝකයට නායකත්වය ලබා දිය හැක්කේ ව්‍යවසායකයින්ට ය. " ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) ව්‍යවසායකත්වය තුළින් අත්වන පුද්ගල හා ආර්ථික ප්‍රතිලාභ **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 02)

iii) (අ) "ව්‍යවහාර මුදලින් ඉටු වන කාර්යයන් සියල්ල ආදේශ මුදල්වලින් ඉටු නොවේ." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) "හොඳ මුදලක දැකිය හැකි ලක්ෂණ කිහිපයකි." ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් ඇසුරෙන් මෙම ප්‍රකාශය පිළිබඳ ව විමසීමක් කරන්න. (ලකුණු 02)

iv) (අ) "මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයකි." මින් අපේක්ෂා කෙරෙන පරමාර්ථ කවරේද? (ලකුණු 03)

(ආ) ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය (SLIPS) පැහැදිලි කරන්න. (ලකුණු 01)

v) වෙනත් පුද්ගලයකුගේ නමින් ලියා ඇති චෙක්පතක් ඔබගේ ජංගම ගිණුමෙහි තැන්පත් කිරීම සඳහා පවරා ගන්නා විට සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද? (ලකුණු 04)

04. i) කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) ප්‍රතිරක්ෂණය

(ආ) ආදේශනය

(ඉ) ප්‍රාරක්ෂණය

(ඊ) රක්ෂණ ඔප්පුව (ලකුණු 1x4)

ii) "ශ්‍රී ලංකාවේ **ප්‍රවාහන පද්ධතියෙහි** ශීඝ්‍ර සංවර්ධනයක් මෑත කාලීන ව සිදු වෙමින් පවතී." සාකච්ඡා කරන්න. (ලකුණු 04)

iii) සන්නිවේදනය ව්‍යාපාර කටයුතුවල දී හා සමාජයීය කටයුතුවල දී වැදගත් වන ආකාරය වෙන් වෙන් ව පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv) (අ) සිල්ලර වෙළෙන්දාගෙන් පහත සඳහන් පාර්ශවයන්ට ඉටු වන කාර්යයන් වෙන් වෙන් ව දක්වන්න.

1) පාරිභෝගිකයාට (ලකුණු 01)

2) නිෂ්පාදකයාට (ලකුණු 01)

(ආ) සිල්ලර වෙළඳාමෙහි දැකිය හැකි නව ප්‍රවණතා මොනවාද? (ලකුණු 02)

v) අනුර, පන්වලින් සාදන ලද විසිතුරු භාණ්ඩ විදේශ වෙළෙඳ පොළ වෙත ලබා දීමට අදහස් කරයි. ඒ සඳහා දැනුම හා මග පෙන්වීම ඔහුට අවශ්‍ය වී ඇත. එම නිෂ්පාදිත අපනයනය කිරීමට අදාල ක්‍රියාමාර්ගය පිළිබඳ ව පියවරෙන් පියවර පැහැදිලි කරන්න. (ලකුණු 04)

## II කොටස

05. i) ව්‍යාපාරයක සාර්ථකත්වය සඳහා කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii) අධිකාරය, වගකීම හා වගවීම යන සංකල්ප පැහැදිලි කර එම සංකල්ප අතර ඇති අන්තර් සම්බන්ධතාව පහදන්න. (ලකුණු 04)

iii) සංවිධාන සටහන යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කර සංවිධාන සටහන ඉදිරිපත් කළ හැකි ආකාර රූපසටහන් මගින් දක්වන්න. (ලකුණු 04)

iv) (අ) මෙහෙයුම් කළමනාකරණයට අයත් කාර්යයක් වන පර්යේෂණ හා සංවර්ධනය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 01)

(ආ) නිෂ්පාදන ආයතනයකට පර්යේෂණ හා සංවර්ධන කටයුතු වැදගත් වීමට හේතු මොනවාද? (ලකුණු 03)

v) පහත සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) මුළු තොග පිරිවැය

(ආ) පරිගණක සමෝධානිත නිෂ්පාදනය (CIM)

(ඉ) ABC විශ්ලේෂණය

(ඊ) ප්‍රවාහ නිෂ්පාදනය (ලකුණු 1x4)

06. i) නිෂ්පාදන ආයතනයක සිදුවන තත්ත්ව පාලනය යනු කුමක්දැයි හඳුන්වා තත්ත්ව පාලනය සඳහා භාවිත කළ හැකි ශිල්ප ක්‍රම මොනවා දැයි සඳහන් කරන්න. (ලකුණු 04)

ii) (අ) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) ඉලක්ක වෙළෙඳ පොළ හා වෙළෙඳ පොළ ඛණ්ඩනය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 02)

iii) (අ) "සන්නාම" යනු කුමක්ද? (ලකුණු 01)

(ආ) සන්නාමකින් ව්‍යාපාරිකයන්ට හා ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ වෙන් වෙන් ව සඳහන් කරන්න. (ලකුණු 03)

iv) නව සබන් වර්ගයක් වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන අලෙවි කළමනාකරුවකු අලෙවිකරණ මිශ්‍රය පිළිබඳව අවධානය යොමු කළ යුත්තේ කෙසේද? (ලකුණු 04)

v) (අ) රටක මූල්‍ය පද්ධතිය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 01)

(ආ) මූල්‍ය ක්‍රමයේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය වන මූල්‍ය යටිතල පහසුකම් **තුනක්** දක්වන්න. (ලකුණු 03)

07. i) (අ) කොළඹ කොටස් හුවමාරුවෙහි හුවමාරු වන මූල්‍ය උපකරණ නම් කරන්න. (ලකුණු 02)

(ආ) කොළඹ කොටස් වෙළෙඳ පොළෙන් සාමාන්‍ය කොටස් මිල දී ගත් ආයෝජකයකුට ලැබෙන ප්‍රතිලාභ මොනවාද? (ලකුණු 02)

ii) (අ) මුදල් අයවැය ලේඛනයක් යනු කුමක්ද? (ලකුණු 01)

(ආ) මුදල් අයවැය ලේඛනයක් පිළියෙල කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන මොනවාද? (ලකුණු 03)

iii) (අ) පුද්ගලයින් ආකර්ෂණය කරගැනීම පිණිස රැකියා දැන්වීම් පළ කිරීම වර්තමානයේ බහුල ව දක්නට ඇත. රැකියා දැන්වීමක ඇතුළත් විය යුතු කරුණු මොනවාද? (ලකුණු 02)

(ආ) රැකියා දැන්වීම් පළ කිරීම සඳහා වර්තමානයේ භාවිත කරනු ලබන මාධ්‍යයන් නම් කරන්න. (ලකුණු 02)

iv) (අ) සේවක පුහුණුව යනු කුමක්ද? (ලකුණු 01)

(ආ) සේවක පුහුණුව සඳහා යොදා ගනු ලබන විවිධ පුහුණු කිරීමේ ක්‍රම **හයක්** නම් කරන්න. (ලකුණු 03)

v) වෘත්තීය සමිතියක් යනු කුමක්දැයි හඳුන්වා එහි අරමුණු පැහැදිලි කරන්න. (ලකුණු 04)

08. i) (අ) තොරතුරු තාක්ෂණය යනු කුමක්ද? (ලකුණු 01)

(ආ) තොරතුරු තාක්ෂණය සැකසී ඇති විවිධ තාක්ෂණික ක්ෂේත්‍ර නම් කරන්න. (ලකුණු 03)

ii) සංවිධානයක තොරතුරු පද්ධතියට පරිගණක වෛරස මගින් සිදු කරන අවදානම් අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග දක්වන්න. (ලකුණු 04)

iii) පහත සඳහන් යුගල අතර වෙනස පැහැදිලි කරන්න.

(අ) බස් ජාල හා මුදු ජාල

(ආ) ප්‍රාදේශීය ක්ෂේත්‍ර ජාල (LAN) හා පුළුල් ක්ෂේත්‍ර ජාල (WAN)

(ඉ) ගනුදෙනු සැකසුම් පද්ධති (TPS) හා කාර්යාල ස්වයංකරණ පද්ධති (OAS)

(ඊ) පාඨ කථන (Text Chatting) හා හඬ කථන (Voice Chatting) (ලකුණු 1x4)

iv) "ව්‍යාපාර සැලැස්මක් සැකසීම තුළින් ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයන් ආකර්ෂණය කර ගැනීම ද අපේක්ෂා කෙරේ." එසේ ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රධාන පාර්ශව හතරක් නම් කර එම පාර්ශවයන් ආකර්ෂණය කර ගැනීමෙන් ව්‍යාපාර අපේක්ෂා කරන්නේ මොනවා දැයි වෙන් වෙන් ව පැහැදිලි කරන්න. (ලකුණු 04)

v) (අ) ව්‍යාපාර සැලැස්මක් සැකසීමේ දී මූල්‍ය විශ්ලේෂණයක් සිදු කිරීම තුළින් අපේක්ෂා කරන්නේ කුමක්ද? (ලකුණු 01)

(ආ) එවැනි මූල්‍ය විශ්ලේෂණයක් සඳහා උපයෝගී කර ගන්නා මූල්‍ය ප්‍රකාශ මොනවාද? (ලකුණු 03)

***